## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

# මල් කුමාරයා

එක් අයෙකුගේ ජීවිතයක සිදු වී ඇති එක් කුඩා සිදුවීමක වෙනත් අයෙකුට එක් එල්ලේ කිසිදු වැදගත්කමක් හෝ ප්‍රයෝජනයක් හෝ නොතිබෙන්නට බොහෝ සේ ඉඩ ඇත. නමුත්, සමහර විටෙක එවැනි අන් අය ලද අත්දැකීම් පිළිබඳව කියවීමෙන් පසු සිතේ පහන් සංවේගයක් ඇති වෙනු මා අත්විඳ ඇත. මේ පහත විස්තර කෙරෙන සරල සිදුවීම ද, ඒ ආකාරයෙන් ම යම් කිසි වෙනසක් ඔබේ සිතේ ඇති කරනු ඇතැයි මම සිතමි.

අපේ චූටි නැන්දා ගේ විවාහය සිදුවුණේ මා කණිෂ්ඨ පාසලේ දෙවන වසරේ ඉගෙනුම ලැබූ කාලයේ ය. හෝඩියේ පන්තිය හෙවත් කින්ඩර්ගාඩන් හෙවත් ප්‍රෙප් හෙවත් පළමුවෙනි වසරක් එකල පාසල් අධ්‍යාපනයේ නොතිබුණු නිසා එවකට මගේ වයස අවුරුදු හයක් පමණ විය.

එකල, තාත්තා, අම්මා, මල්ලිලා දෙදෙනා ඇතුළු අපේ පවුල ද ජීවත් වුයේ විවාහාපේක්ෂිත චූටි නැන්දා ද, ආච්චී සහ සීයා ද විසූ තාත්තාගේ මහ ගෙදර ය.

චූටි නැන්දා ගේ විවාහ උත්සවය සඳහා මල් කුමරෙකු සහ මල් කුමරියක අවශ්‍ය බව කියවුණි. මෙය ඊට වසර දෙකකට කලින් විවාහ වූ අපේ නන්දා නැන්දා ගේ විවාහ උත්සවයේ දී හෝ ඒ කාලයේ මස සහ ඊට පසුව සිදුවුණු අපේ පුංචි අම්මලා ගේ විවාහ උත්සවවල නොතිබුණු සුවිශේෂී අංගයක් විය. නැන්දා තම කැමැත්ත අනුව තම වැඩිමහල් සොහොයුරා ගේ වැඩිමහල් පුත්‍ර රත්නය වූ මා, ඇගේ විවාහය දිනයේ දී මල් කුමරා ගේ චරිතය රඟපාන්නට තෝරා ගත්තා ය. මල් කුමරිය ලෙස අසල නිවසක සිටි නැන්දා ගේ හිතවත් ගුරුවරියක වූ ශීලා නැන්දා ගේ දියණිය, කුමුදුනී, නම් වී තිබුණි. ඇය මා හා සම වයසේ සිටියේ යැයි සිතමි.



**<u>මංගල උත්සවය සඳහා කුමුදුනීට සැරසීමට මල් කුමාරී ඇඳුමක් ඇගේ මව සතුව තිබුණි. ඊට ගැලපෙන පරිදි මල් කුමරා ඇඳිය යුතු වූයේ සිල්ක් දිග කලිසමක් සහ රැළි දැමූ සිල්ක් කමිසයකි. මල් කුමරිය කුඩා මල් පොකුරක් අත දැරිය යුතු වූ අතර මල් කුමරා සඳහා පොඩි බස්තමක් වැනි පොලු කෑල්ලක් අත දැරීමට ද නියමිතව තිබුණි.</u>**

මංගල උත්සවය සඳහා කුමුදුනීට සැරසීමට මල් කුමාරී ඇඳුමක් ඇගේ මව සතුව තිබුණි. ඊට ගැලපෙන පරිදි මල් කුමරා ඇඳිය යුතු වූයේ සිල්ක් දිග කලිසමක් සහ රැළි දැමූ සිල්ක් කමිසයකි. මල් කුමරිය කුඩා මල් පොකුරක් අත දැරිය යුතු වූ අතර මල් කුමරා සඳහා පොඩි බස්තමක් වැනි පොලු කෑල්ලක් අත දැරීමට ද නියමිතව තිබුණි.

මල් කුමරා ගේ ඇඳුම් කට්ටලය නැන්දාට සපයා දීමට ඇය සමග එකම පාසලේ සේවය කළ ගුරුවරියක වූ එදිරිසිංහ ටීචර් පොරොන්දු වී තිබුණි. මේ එදිරිසිංහ ටීචර් යනු ගායක සුනිල් එදිරිසිංහ ගේ සහ සිනමා නළු සතිශ්චන්ද්‍ර එදිරිසිංහ ගේ සොහොයුරිය බව මගේ මතකයයි.

ඇඳුම් කට්ටලය ගෙන ඒම සඳහා නැන්දා මා ද කැටුව එක්තරා සෙනසුරාදාවක සපුගස්කන්ද බලා ගියා ය. එදිරිසිංහ ටීචර් ගේ නිවසේ දී මල් කුමාරයාගේ ඇඳුම් කට්ටලය ඇඳ පිරික්සා බැලූ විට වැටහුණේ සිල්ක් කලිසමට යාන්තමින් බැසීමට මට හැකි වුණ ද, දිගෙන් එය අඟල් හයක් පමණ කොට බවයි. එසේ ම, සැටින් රෙද්දෙන් මසා තිබුණු රැළි රැළි කමිසයේ බොත්තම් පියවීම ද තරමක් අසීරු විය.

කොටින් ම එය මා වැනි අවුරුදු හයක් වයසැති ළමයෙකු සඳහා නොව, අවුරුදු හතරක හෝ පහක හෝ කොලුවෙකු සඳහා නිසි පරිදි මිනුමේ ගෙන මසන ලද ඇඳුම් කට්ටලයකි.

දැන් කුමක් කරන්නද?

යම් තීරණයක් ගත් නැන්දා මා කැටුව ආපසු අපේ මහ ගෙදරට ගියේ ඇඳුම් කට්ටලය ද රැගෙන ය.

ඇය කලිසමේ වාටිය දිග හැර එය දිගු කරනු ඇති ය, කමිසය ද වාටි ලිහා මදක් විශාල කරනු ඇති ය යනුවෙන් මට නිකමට මෙන් සිතුණි.

නමුත් සිදුවූයේ එය නොවේ!

මල් කුමාරායට අනුව ඇඳුම සෑදීම නොව, ඇඳුමට අනුව, එයට ගැලපෙන මල් කුමාරයෙකු සොයා ගැනීමයි.

මල් කුමාරයාට නියමිත ඇඳුමට මා නොගැළපුණු හේතුවෙන්, මංගල උත්සවයේ මල් කුමරා චරිතය මට වඩා වසරකින් බාල මෙන් ම, එකල මට වඩා තරමක් සිහින් කොට සිරුරක් ද හිමිව සිටි පස් හැවිරිදි, මගේ මල්ලී රුවන්ට හිමිවිය.

සති දෙකකට පමණ පසු අපේ චූටි නැන්දා, ධර්මසේකර මාමා සමග විවාහ වූවා ය. එදා විවාහ උත්සවයේ දී මගේ රුවන් මල්ලී මල් කුමාරයා වූ අතර මම නිකම්ම නිකම් ප්‍රේක්ෂකයෙකු පමණක් වීමි!



# දඹදිව

**සියලු පහසුකම් සහිත සුඛෝපභෝගී විශේෂ දඹදිව වන්දනා චාරිකා** *

බුද්ධගයා, රාජ්ගිර්, වෛශාලි, කුෂිනගර්, ලුම්බිණි / කපිලවස්තු, ශ්‍රාවස්ති, වරණාසි

CHARIKA TRAVELS

**Special Pilgrimages for Dambadiva***

• Smaller Groups (ideal for families & friends) • 09 or 10 days Tours • Star Class Hotel Accommodation • Air-conditioned comfortable Vehicles (No Train travel) • Customised Tours if necessary *

* Terms & Conditions Apply. Minimum number of Passengers per group apply

**Contact us for details**

**www.charikatravels.com/dambadiva**

**Tel: (03) 8804 1488**

**Email: tours@charikatravels.com**

**Celink Australia Pty Ltd** trading as **CHARIKA TRAVELS**